**සීතාවක ප්‍රාදේශීය සභාව, හංවැල්ල**
**2025 වර්ෂයට කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.**

2025 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන කොන්ත්‍රාත්කරුවන්/ අනුමත ස්වේච්ඡා සංවිධාන/ සැපයුම්කරුවන් හා නිෂ්පාදකයින් ගෙන් 2024.12.25 දින ප.ව. 3.00 දක්වා මා විසින් ඉල්ලුපත්‍ර කැඳවනු ලැබේ.

සියළුම ඉල්ලුම්පත්‍ර තම ආයතන (ඇත්නම්) ලිපිනය හා අනෙකුත් විස්තර සමඟ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක. පහත දැක්වෙන ආකෘතිය පරිදි අදාල ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතුය. ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ "සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2025 " ලෙස සඳහන් කළ යුතුය. අදාල ඉල්ලුම් පත්‍රය අපගේ www.seethawaka.ps.gov.lk වෙබ් අඩවියෙන් ද බාගත කරගත හැක.

සියළුම සැපයුම් හා සේවා සඳහා රු. 2000.00 ක මුදලක් ලියාපදිංචි වීමේ අයදුම්පත්‍ර ගාස්තු ලෙස ගෙවිය යුතු අතර, ඒ සඳහා "සභාපති, සීතාවක ප්‍රාදේශීය සභාව" නමට ලියන ලද චෙක්පතකින් හෝ මුදලින් ඔබගේ ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

සියළුම සැපයුම්කරුවන් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල නියම කරනු ලබන ස්ථානයන්ට භාණ්ඩ ගෙනවිත් භාරදිය යුතු බව ලියාපදිංචි වීමට අදහස් කරන සැපයුම්කරුවන් වෙත අවධාරණය කරමි.

සියළුම කොන්ත්‍රාත්කරුවන් රු. 2000.00 ක මුදලක් ලියාපදිංචි වීමේ අයදුම්පත්‍ර ගාස්තුව ලෙස ගෙවිය යුතු අතර, ඉල්ලුම්කරන කොන්ත්‍රාත්තු වටිනාකමට සමාන වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය ලේකම් මඟින් ලබාගෙන ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. සාර්ථක කොන්ත්‍රාත්කරුවන් බවට සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ICTAD (CIDA) ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වටිනාකම් සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

**1. භාණ්ඩ / ද්‍රව්‍ය**

1) කාර්යාලීය ලිපි ද්‍රව්‍ය සැපයීම. (පෑන්, පොත්, කඩදාසි වර්ග, දින මුද්‍රා හා රබර් මුද්‍රා)
2) කාර්යාලීය ගෘහ භාණ්ඩ සැපයීම. (ලී බඩු හා වානේ බඩු)
3) කාර්යාලීය උපකරණ හා අමතර කොටස් සැපයීම. (ගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක අමතර කොටස්, සියළුම ටෝනර් හා රිබන් වර්ග)
4) වීථි පහන්, විදුලි භාණ්ඩ හා උපකරණ සැපයීම. (වීථි පහන්, වයර්, ස්විච් ඇතුළු සියළුම විදුලි උපකරණ)
5) වාහන උපාංග හා අමතර කොටස් සැපයීම. (ටයර්, ටියුබ්, බැටරි හා අමතර කොටස්)
6) පරිගණක යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර සැපයීම.
7) තීන්ත වර්ග ඇතුළු හාඩ්වෙයාර් අයිතම සැපයීම. (උදළු, සවල්, කැති, මන්නා, ගොඩනැගිලි ද්‍රව්‍ය, යකඩ, බට)
8) සෞඛ්‍ය/ සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ සැපයීම. (කොසු, ඉදල්, ගම් බූට්ස්, අත් ආවරණ, විෂබීජ නාශක දියර, සියළුම පිරිසිදු කාරක දියර වර්ග)
9) කර්මාන්ත උපකරණ සැපයීම. (ගල්, වැලි, පස්, සිමෙන්ති)
10) තාර හා කෝල්ලාස් සැපයීම.
11) වෛද්‍ය උපකරණ හා ඖෂධ වර්ග සැපයීම. (ආයුර්වේද ඖෂධ වර්ග)
12) කෙටි ආහාර, වියළි ආහාර ද්‍රව්‍ය හා පානීය ජල බෝතල් සැපයීම.
13) පෙර පාසල් උපකරණ හා ක්‍රීඩා භාණ්ඩ සැපයීම.
14) නිල ඇඳුම් හා රෙදි වර්ග සැපයීම.
15) ශිලා ඵලක හා සිහිවටන සැපයීම.
16) නිල හැඳුනුම්පත් හා පුස්තකාල හැඳුනුම්පත් සැකසීම.
17) කෘමි නාශක, වල් නාශක හා පොහොර සැපයීම.
18) හියුම් පයිප්ප සැපයීම.
19) හට් වර්ග සැපයීම. (කැනපි හට්)
20) වීදුරු හා වීදුරු භාණ්ඩ සැපයීම.
21) පොලිතීන් උර හා පොහොර උර සැපයීම.

**2. සේවා**

22) ලිපි ද්‍රව්‍ය මුද්‍රණ කටයුතු (ආකෘති පත්‍ර, පොත් හා ෆයිල් කවර මුද්‍රණය)
23) බැනර් හා නාම පුවරු සැකසීම.
24) පරිගණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම (මෘදුකාංග ඇතුළු)
25) මිනින්දෝරු සේවා සැපයීම.
26) නීතිඥ සේවා සැපයීම.
27) වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට සැපයීම. (පස් කපන යන්ත්‍ර, ස්කැවේටර් යන්ත්‍ර, මාර්ග තලන, ස්කයි කැබ්, වෑන් රථ, ලොරි රථ හා කන්ටේනර්)
28) ගස් කැපීමේ හා බෑදීමේ සේවා සැපයීම.
29) වාහන අළුත්වැඩියා කිරීම හා සේවා කිරීමේ සේවාව සැපයීම.

30) එල්. පී. ගෑස් සැපයීම.
31) හිස් බෝතල්, පරණ යකඩ, පරණ පුවත්පත් මිලදී ගැනීම.
32) ටයර් රී බිල්ඩ් කිරීමේ සේවාව සැපයීම.
33) ශබ්ධ විකාශන යන්ත්‍ර සේවා සැපයීම.
34) වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම හා අළුත්වැඩියා කිරීමේ සේවාව සැපයීම.

**3. කොන්ත්‍රාත්කරුවෝ පහත කොන්ත්‍රාත් වටිනාකම් හා CIDA ශ්‍රේණි අනුව ලියාපදිංචිය සිදු කරනු ලබයි.**

| අනු අංක | කොන්ත්‍රාත් වටිනාකම | CIDA ශ්‍රේණි |
|---|---|---|
| 01 | මිලියන 02 ට සමාන හෝ අඩු | C9 හා C8 |
| 02 | මිලියන 02 ට වැඩි හා මිලියන 05 ට සමාන හෝ අඩු | C8 හා C7 |
| 03 | මිලියන 05 ට වැඩි හා මිලියන 10 ට සමාන හෝ අඩු | C7 හා C6 |
| 04 | මිලියන 10 ට වැඩි හා මිලියන 25 ට සමාන හෝ අඩු | C6 හා C5 |
| 05 | මිලියන 25 ට වැඩි හා මිලියන 50 ට සමාන හෝ අඩු | C5 හා C4 |

**4. කොන්දේසි**

1) ඉහත සැපයුම් හා සේවා/ කොන්ත්‍රාත් එක් එක් වර්ගයන් සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර ඒ සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත්‍ර ගාස්තු ගෙවීම කළ යුතුය.
2) ලියාපදිංචි සුදුසුකම් ඇති ඕනෑම සැපයුම්කරුවකුට/ කොන්ත්‍රාත්කරුවකුට ඉදිරිපත් විය හැකි අතර ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සාමාන්‍යයෙන් මාස 06 ක කාලයක් තුළ වෙනස් නොකර ස්ථාවර තත්ත්වයක තබා ගැනීම කළ යුතුය.
3) සැපයුම්කරුවන් දින 30 ක කාලසීමාවක් සඳහා ණය බිල්පත් මත ද්‍රව්‍ය හා සේවාවන් සැපයීමට එකඟ විය යුතුය.

**5. ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි**

1) සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා එක් එක් සේවා වෙනුවෙන් වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
2) එකම සැපයුම්කරුවෙකු/ කොන්ත්‍රාත්කරුවකු සේවාවන් එකකට වඩා වැඩි සේවා ගණනක ලියාපදිංචිය අවශ්‍ය වන්නේ නම් එක් එක් සේවා සම්බන්ධයෙන් ලියාපදිංචි වීමේ අයදුම්පත්‍ර ගාස්තු ගෙවිය යුතුය.
3) සංස්ථාවක් නම් සංස්ථාවක් ලෙස නීතිගත කළ බවට දෙන සහතිකය.
4) තනි පුද්ගල ව්‍යාපාරයක් නම් ලියාපදිංචි කිරීමේ සහතිකය.
5) සමාගමක් නම් සමාගම් පනත අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය.
6) VAT අයකරන ආයතනයක් නම් VAT ලියාපදිංචි සහතිකයේ පිටපතක්.

**6.** අවශ්‍යයයි හැඟෙන අවස්ථාවලදී ලියාපදිංචි සැපයුම්කරුවන්ට/ කොන්ත්‍රාත්කරුවන්ට පරිබාහිරව වෙනත් සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් භාණ්ඩ හා සේවාවන් සඳහා මිල ගණන් ලබා ගැනීමේ අයිතිය සීතාවක ප්‍රාදේශීය සභාව සතුව පවතී.

**7.** භාණ්ඩ හා සේවා සපයා ගැනීමේදී අදාල භාණ්ඩය හෝ සේවාව සපයාගනු ලබන්නේ කාගෙන්ද යන්න නිශ්චය කිරීමට තීරණය, ඇගයීම් කමිටුවක නිර්දේශය මත ටෙන්ඩර් කමිටුවක හා සභාපති විසින් අවස්ථානෝචිත පරිදි තීරණය කරනු ඇත.

**8.** සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීමෙන් සභාවට සපයා ගත යුතු සේවාවන් ඔවුන්ගෙන් පමණක්ම ලබාගත යුතුය යනුවෙන් වන අයිතිවාසිකමක් ඔවුන්ට නොවිය යුතුය.

**9. ආදර්ශ අයදුම්පත්‍රය :**

**සීතාවක ප්‍රාදේශීය සභාව**

**.................................. වර්ෂයට සැපයුම්කරුවකු/ කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා අයදුම්පත්‍රය**

1. සැපයුම්කරුගේ/ කොන්ත්‍රාත්කරුගේ ආයතනයේ නම :
2. සැපයුම්කරුගේ/ කොන්ත්‍රාත්කරුගේ ආයතනයේ ලිපිනය :
3. දුරකථන අංකය :
   i. ස්ථාවර දුරකතන අංකය :
   ii. ජංගම දුරකතන අංකය :
4. ඊ - මේල් ලිපිනය :
5. ෆැක්ස් අංකය :
6. ව්‍යාපාර ලියාපදිංචි අංකය :

7. ව්‍යාපාරයේ ස්වභාවය :
8. ලියාපදිංචි කළ යුතු භාණ්ඩ/ සේවාවන්වල කාණ්ඩය :
9. ගිණුම් පවත්වාගෙන යන බැංකුවේ නම :
10. ණය පහසුකම් සැපයිය හැකි කාල සීමාව :
11. සාර්ථක කොන්ත්‍රාත්කරුවකු බවට සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලිඛිත සාක්ෂි :
12. ICTAD ආයතනයේ ලියාපදිංචි නම් ලියාපදිංචි අංකය :
13. වැට් (VAT) බදු අංකය (ඇත්නම්)
14. සැපයුම්කරුවකු/ කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා අයදුම්පත්‍ර ගාස්තු : රු. 2000.00
(ඉදිරියේදි රජය විසින් අයදුම්පත්‍ර ගාස්තු සඳහා යම් බද්දක් පැනවුව හොත් එම බද්ද ගෙවීමට බැඳී සිටිය යුතුය)

ඉහත මුදල මුදලින්/ අංක .................................................. දරණ චෙක්පත මඟින් ගෙවන අතර මා/ අප විසින් සඳහන් කරන ලද විස්තර සියල්ලම නිවැරදි බවත් සීතාවක ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් පනවනු ලබන කොන්දේසි වලට අනුව භාණ්ඩ/ සේවාවන් සැපයීමට හා කොන්ත්‍රාත්තු ඉටු කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන අතර ඒ සඳහා සැපයුම්කරුවකු/ කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි කරගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

දිනය :
අයදුම්කරුගේ නම :
අයදුම්කරුගේ අත්සන හා නිළ මුද්‍රාව :

ලේකම් හා සීතාවක ප්‍රාදේශීය සභාවේ බලතල,
කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
සීතාවක ප්‍රාදේශිය සභාව
2024-11-11